ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
දිනය 2018.01.30

## ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සංවත්සරය සැමරීම නිමිත්තෙන් සංසරණ තත්ත්වයේ පවතින සමරු මුදල් නෝට්ටුවක් නිකුත් කිරීම

2018 පෙබරවාරි 4 දිනට යෙදී ඇති ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සංවත්සරය සැමරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් 1000 ක වටිනාකමින් යුත් සමරු මුදල් නෝට්ටුවක් නිකුත් කරන ලදී. මෙය මහ බැංකුව විසින් නිකුත් කරන ලද 4 වැනි සමරු මුදල් නෝට්ටුව ද වේ.

සමරු මුදල් නෝට්ටුවේ විශාලත්වය, ප්‍රමුඛ වර්ණය හා ආරක්ෂණ සළකුණු දැනට සංසරණයේ පවතින 11 වැනි කාණ්ඩයට අයත් රුපියල් 1000 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටුවේ හා සමාන වන අතර පහත සඳහන් වෙනස් කම් පමණක් සිදු කර ඇත.

නෝට්ටුවේ මුහුණත (පහත දැක්වේ)

i. දැනට සංසරණයේ පවතින 11 වැනි කාණ්ඩයට අයත් රුපියල් 1000 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටුවේ වම්පස පහළ කෙළවරේ සමනල රූපය වෙනුවට විවධත්වය සැමරීමේ ලාංඡනය දිස් වේ.
ii. දැනට සංසරණයේ පවතින 11 වැනි කාණ්ඩයට අයත් රුපියල් 1000 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටුව මධ්‍යයේ වූ රම්බොඩ උමගේ රූපය වෙනුවට පන්සල, මුස්ලිම් පල්ලිය, දමිළ කෝවිල හා ක්‍රිස්තියානි පල්ලිය දිස් වේ.
iii. නෝට්ටුවේ S අනුක්‍රමික උපසර්ගය වෙනුවට S70 අනුක්‍රමික උපසර්ගය දිස්වේ.




සමරු මුදල් නෝට්ටුවේ මුහුණත

නෝට්ටුවේ පිටුපස: දැනට සංසරණයේ පවතින 11 වැනි කාණ්ඩයට අයත් රුපියල් 1000 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටුවේ පවතින රූප එලෙසම පවතී.

අනුක්‍රමික අංක S70/1 000001 සිට S70/5 1000000 දක්වා මුදල් නෝට්ටු මිලියන 5 ක් නිකුත් කරනු ලැබේ. නෝට්ටුවේ දිනය 2018.02.04 ලෙස සඳහන් වේ.

මේ මුදල් නෝට්ටුව ශ්‍රී ලංකාව ඇතුළත ඕනෑම මුදල් ගණනක් ගෙවීම සඳහා නීතියෙන් වලංගු වන අතර මෙය සංසරණයේ පවතින කාලය තුල ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමක්ද වේ.

2018.01.30 දින මෙම මුදල් නෝට්ටුව ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා වෙත නිල වශයෙන් පිළිගන්වන ලදී.

2018.02.06 දින සිට මෙම සමරු මුදල් නෝට්ටුව බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා සංසරණයට නිකුත් කරනු ලැබේ. එමෙන්ම, මුල් අනුක්‍රමික අංක සහිත මුදල් නෝට්ටු සීමිත ප්‍රමාණයක් ආකර්ෂණීය ෆෝල්ඩරයක් සමග ඒකක වටිනාකම රුපියල් 1300 ක මිලකට කොළඹ 01, චැතැම් වීදියේ අංක 54 දරන ස්ථානයේ පිහිටි සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලේ ඇති ආර්ථික ඉතිහාස කෞතුකාගාරයෙහි හා අනුරාධපුරය, මාතර, මාතලේ, ත්‍රිකුණාමලය හා කිලිනොච්චියෙහි පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු පළාත් කාර්යාල වලදී අලෙවි කරනු ලැබේ.